www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# රුසියානු විප්ලවයේ පටන් අනූවසරක්, විසි එක්වෙනි සියවසේ සමාජවාදය සඳහා අවස්ථාවන්

## දෙවන කොටස

## Ninety years since the Russian Revolution: The prospects for socialism in the twenty-first century

**නික් බීම්ස් විසිනි**
**2007 නොවැම්බර් 26**

*මෙහි පලවන්නේ ඕස්ට්‍රේලියානු සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම් නික් බීම්ස් විසින් පසුගිය මැතිවරන රැස්වීම්වල පැවැත්වූ දේශන මාලාවේ දෙවැන්නයි. තුන්වන කොටස ඉදිරි දිනක පලවනු ඇත.*

නොයෙකුත් දක්ෂිනාංශික ඉතිහාසඥයන් ප්‍රකාශකරන පරිදි බොල්ෂෙවික්වාදයේ මූලයන් ගැබ්ව තිබුනේ ආඥාදායකත්වයක් ගොඩනැංවීම සඳහා ලෙනින් දැරූ උත්සාහය තුල නොව බර්න්ස්ටයින් හා රුසියානු ව්‍යාපාරය තුල ඊනියා ආර්ථිකවාදීන් ලෙස හැඳින්වූ ඔහුගේ අනුගාමිකයන්ගේ සංකල්පවලට එරෙහිව සමාජවාදී ව්‍යාපාරය තුල ගෙන ගිය අරගලයෙන් ඔහු එලඹගත් දුර දක්නා නිගමනයන් තුල ය.

1890 ගනන්වල කාර්මික පිබිදීමෙන් හටගත් රුසියානු කම්කරු පන්තියේ ප්‍රසාරනය මෙන්ම එහි නැගෙන සටන්කාමිත්වයට ප්‍රතිචාර වශයෙන් ආර්ථකවාදීන් කියා සිටියේ පක්ෂයේ කර්තව්‍ය වනාහි අර්ථික අරගලය සංවිධානය කිරීම හා අවශ්‍යවූවිට ප්‍රතිසංස්කරන සඳහා ඉල්ලීම්වල ස්වරූපයෙන් එයට ක්ෂනික දේශපාලන ස්වභාවයක් ගෙනදීම බවයි. වෙනත් වචනවලින් කිව හොත් ආර්ථිකවාදීන්ගේ ඉදිරිදර්ශනය වූයේ රුසියානු සමාජවාදී ව්‍යාපාරය වෘත්තීය සමිතිවාදයේ ඇල මං ඔස්සේ දැක්කීම ය.

කෙසේ වුව ද මෙය මුල්බැස තිබුනේ අති මූලිකව වෙනස්වූ ප්‍රවිශ්ඨයක් හා ඉදිරිදර්ශනයක් තුලය. මක්නිසාද යත් වෘත්තීය සමිතිවාදය, වඩා හොඳ වැටුප් හා සේවා තත්වයන් ද, තම අවශ්‍යතාවන්ගේ ආරක්ෂාව සඳහා නීති පනවාගැනීමට පවා සිය හාම්පුතුන්ට එරෙහිව කම්කරුවන්ගේ අරගලය යොමුව තිබුනු නමුත් කිසි විටෙකත් ධනේශ්වර සමාජයේ රාමුව ඉක්මවා ගියේ නැති බැවින්ය.

පක්ෂය සඳහා අවශ්‍යතාවත් එහි දේශපාලන ස්වභාවයත් පැන නගින්නේ ධනේශ්වර සමාජයේ ම ස්වභාවයෙන් බව ලෙනින් කල යුත්තේ කුමක්ද? යන සිය කෘතිය තුලින් තහවුරු කලේය.

කම්කරු පන්තිය ස්වයංසිද්ධව ම සමාජවාදය කරා ආකර්ෂනය වූ නමුදු ධනේශ්වර දෘෂ්ටිවාද මත් ස්වයංසිද්ධව යලි යලිත් පැන නංවයි. මෙයට හේතුව එම දෘෂ්ටිවාදය වසර සිය ගනනක් පැවතීමත්, පාලක පන්තීන් සංස්කෘතියේ ද්‍රව්‍යමය පදනම් සියතෙහි තබාගැනීමත්. ධනවාදයේ මූලික සමාජ සම්බන්ධතා ඔවුන් විසින් පවත්වා ගෙන යාමත් ය.

ඒ අනුව ලෙනින් අවධරනය කලේ කම්කරු පන්තිය තුලට සමජවාදය ගෙන ඒම සඳහා

සංවිධිත අරගලයක් ගෙන යා යුතු බවයි. එය කම්කරු පන්තිය හා හාම්පුතුන් අතර ක්ෂනික අරගලයෙන් ස්වාධීනව, පිටත සිට ගෙන යා යුතු ය. පක්ෂයේ ඓතිහාසික කර්තව්‍යය රැඳී අත්තේ මෙහි ය. සය වසරකටත් වැඩි කාලයක පටන් මෙය තරම් මාක්ස්වාදයේ විරුද්ධවාදීන්ගේ වෛරයට පාත්‍රවූ වෙනත් සංකල්පයක් නොවීය. "වාමාංශයේ පෙනී සිටින්නවුන් කම්කරු පන්තිය සිය විමුක්තිය තමා විසින් ම සාක්ෂාත් කර ගත යුතු ය"යි මාක්ස් අවධාරනය කර ඇති බව කියා සිටිති. ලෙනින්, කම්කරු පන්තිය මත ඒකාධිපතිත්වයක් පවත්වා ගෙන ගිය වෘත්තීය විප්ලවවාදීන් කම්කරු පන්තියට ආදේශ කල බව ඉන් පසු ඔවුහු කියා සිටිති.

සැබවින්ම මාක්ස් හා ලෙනින් අතර විසංවාදයක් නො වී ය. කම්කරු පන්තිය ම විසින් පමනක් සමාජවාදී විප්ලවය ගෙන යනු ඇත. එහෙත් කම්කරු පන්තියට තමා ද සමස්ත මානව වර්ගයාම ද විමුක්ත කර ගත හැක්කේ ඔවුන් දේශපාලනිකව ස්වාධීන බලවේගයක් ලෙස කටයුතු කරන්නේ නම් පමනි. ධනේශ්වර පර්යායට කම්කරු පන්තිය යටත්කර තැබීම සඳහා එක් හෝ තවත් අතකින් උත්සාහ දැරූ සියලු දේශපාලන ප්‍රවනතාවන්ට එරෙහිව විප්ලවවාදී පක්ෂය විසින් ගෙන ගිය අඛන්ඩ අරගලයක් තුලින් එම දේශපාලන ස්වාධීනත්වය පිහිටුවා හා යලි පිහිටුවා තිබේ. සමාජවාදී ව්‍යාපාරය තුල ලෙනින්ගේ විරුද්ධවාදීහු ඔහුගේ "කලහකාරී" "කෙස් පැලෙන" "කන්ඩායම්වාදී" හා "උද්ධච්ච" කමේ ගතිගුන පිලිබඳව, කෙටියෙන් කිව හොත් එදා පටන් අද දක්වාමත් මාක්ස්වාදීන්ට එරෙහිව අවස්ථාවාදීන් විසින් එල්ල කෙරෙන සියලු චෝදනා යලි යලිත් ඔහු වෙත දමා ගැසූහ.

සම්මුති විරහිත ලෙනින්ගේ ආස්ථානය පදනම් වූයේ නිශ්චිත දේශපාලන සංකල්පයක් මතය. එනම් සමාජවාදී ව්‍යාපාරය තුල පැවති මතභේද හුදෙක් වචන පිලිබඳ ඒවා නොවූ අතර ප්‍රකාශිත වූයේ වෙනස්වූ පන්ති බලවේගයන්ගේ හා ප්‍රවනතාවන්ගේ පීඩනය යි. රුසියානු විප්ලවයට තුඩුදුන් පුපුරන සුලු සිද්ධීන්ගේ ගමන් මාවතේදී ඔහු ගේ සංකල්පය බලගතු ලෙස සනාථ විය.

සමාජවාදයේ අවශ්‍යතාවය මතු කරන, බිඳ වැටීම කරා යොමුවන ධනවාදය තුල කුමන හෝ ප්‍රවනතාවක් ප්‍රතික්ෂේප කිරීම මගින්, මාක්ස්වාදී ඉදිරිදර්ශනයට බර්න්ස්ටයින් එල්ල කරන ප්‍රහාරය ගලා ආවේ 1890 ගනන් මැද භාගයේ සිට ධනවාදයේ ඉහල නැගීමෙන් නිර්මිත ඉසුරුමත් භාවයෙනි.

එහෙත් ඊට වඩා නො අඩු බලයකින් යුත් තවත් වෙනසක් ද ලෝක ආර්ථික හා දේශපාලන ව්‍යුහය තුල පැවතුනි. එය ද නොමඳ බලපෑමක් යෙදී ය. දහනමවන සියවසේ අවසාන කාර්තුවේ අන්තර් සම්බන්ධිත ක්‍රියාවලීන් දෙකක් දැක ගත හැකි විය, බටහිර යුරෝපය තුල ජාතික රාජ්‍යයන් ගොඩ නංවා තහවුරු කිරීමත්, නව දේශපාලන රාමුව ඇතුලත කාර්මික කරනය ප්‍රසාරනය වීමේ ප්‍රතිඵලය ලෙස කම්කරු පන්තියේ වර්ධනය ද යන දෙක ය.

සමාජවාදී විප්ලවයේ සම්භවය, ධනේශ්වර නිෂ්පාදන බලවේගයන්ගේ වර්ධනයත්, ඒවා පැන නැගී බන්ධන ගතවූ පැරනි සමාජ සම්බන්ධතාවන් ද අතර ගැටුම මාක්ස් සොයාගෙන තිබුනි. ලෝක ඓතිහාසික බලවේගයක් ලෙස ධනවාදය වර්ධනය වන බව ඔහු අවධාරනය කරනු ලැබුව ද, ඔහුගේ ඉදිරි දර්ශනය වඩ වඩාත් අර්ථ දක්වනු ලැබුවේ තරමක් යාන්ත්‍රික ස්වරූපයකින් ය. ආරම්භක ලක්ෂය වනු ඇත්තේ ලෝක ආර්ථිකය නොව අලුතින් වර්ධනය වූ ජාතික රාජ්‍යයේ රාමුවයි.

ට්‍රොට්ස්කි පසුව පැහැදිලි කල පරිදි, දෙවැනි ජාත්‍යන්තරයේ සමාජවාදී පක්ෂ සමාජවාදී විප්ලවය පරිකල්පනය කලේ ඒ ආකාරයට ය. සමාජවාදයේ කනිසම නාද වනු ඇත්තේ සෑම ජාතික රාජ්‍යයක් තුල ම නිෂ්පාදන බලවේග ඒවායේ පූර්න පරිමානයට වර්ධනය වූ විටය. මෙම දෘෂ්ටියට අනුව බ්‍රිතාන්‍යය, ජර්මනිය, ඉතාලිය, ප්‍රන්සය, හා රුසියාව යන යුරෝපයේ ප්‍රධාන රටවල් ස්වාධීන වැයික්කි ලෙස සලකන ලදී. ඒවා එක ම ගමනාන්තයක් කරා ලගාවෙමින් තිබුනේ වී නමුත් ස්ථානගතව තිබුනේ පථයේ වෙනස් වූ තැන්වල ය. ජර්මනිය පෙරමුනේ ම පසුවිය. අනෙක්වා පසුපසින් ගමන් ගත්තේ ය. රුසියාව තුල තව මත් පැවතුනේ රාජාන්ඩු පාලනයකි. ධනේශ්වර විප්ලවය තව මත් ඇතින් පැවතිනි.

## ට්‍රොට්ස්කිගේ නොනවතින විප්ලව න්‍යාය

ප්‍රථම රුසියානු විප්ලවය මෙම සැලැස්ම පුපුරවා හැරියේය. නව යුගයක ඉස්මතුවීම සලකුනු කරමින් වැඩවසම් සාර්වාදී රාජාන්ඩුවට එරෙහිව වැඩ වර්ජන හා පෙලපාලි පැනනැංගේ වෙන කවරදාක වත් නොදුටු ආකාරයෙනි. මෙම කැලඹිලිකාරී සිදුවීම්වල ගමන් මාවතේදීම ට්‍රොට්ස්කිගේ නොනවතින විප්ලව න්‍යාය විස්තාරනය කරන ලද අතර එමගින් සිදුවෙමින් පැවතුනේ කුමක්ද යන්න පිලිබඳ අවබෝධය හා එයට මැදිහත්වීම සඳහා අවශ්‍ය ඉදිරිදර්ශනය යන දෙකම සම්පාදනය කරන ලදී. මාක්ස්වාදී න්‍යායේ සියලු වර්ධනයන්හිදී මෙන්ම ඔහුගේ නිර්මානාත්මක ප්‍රතිචාරයද පදනම් වූයේ ප්‍රගාඪ ඓතිහාසික විශ්ලේෂනයක් මතය.

රුසියාව ධනේශ්වර වවිප්ලවයකට මුහුන දී සිටින බව සෑම මාක්ස්වාදියෙකු ම පිලිගත්තේ ය. වෙනත් වචනවලින් කිව හොත් ප්‍රධාන දේශපාලන කර්තව්‍යය වූයේ සාර්වාදී රාජාන්ඩුව පෙරලා දමා බටහිරදී දිනා ගෙන තිබෙන ප්‍රජාතන්ත්‍රවාදී නිදහස පිහිටුවා ලීම යි. එහෙත් මෙය ඉටු කරනු ලබන්නේ කෙසේද? රුසියාව, 1789 දී ධනේශ්වරය විසින් විප්ලවය මෙහෙයවූ ප්‍රන්සය නො වී ය. කම්කරු පන්තිය තව මත් දර්ශන පථයට පැමින නො සිට එහි දී පැරිසියේ මහජනතාවගේ ද ගොවි ජනතාවගේ ද මුදුන අරක්ගෙන සිටියේ ධනේශ්වරය යි. එය 1848 ජර්මනිය ද නො වී ය. එහි දී කම්කරු පන්තියේ මතුවීම, ධනේශ්වරය බියවද්දා ප්‍රතිගාමීත්වයේ කඳවුරට දැක්කීමට තරම් ප්‍රමානවත් වුව ද, කම්කරු පන්තිය තමන්ගේ ම අතට බලය ගැනීමට තරම් ශක්තිමත්ව සිටියේ ද නැත.

රුසියාව ධනේශ්වර විප්ලවයකට මුහුන දී සිටිය ද, ඩැන්ටන් හා රොබෙස්පියර් වැනි ප්‍රන්ස විප්ලවවාදීන්ට සමාන වූ රුසියානුවන් සිටියේ කොහිද? එවැනි අය සිටියේ නැත. පැරිසියේ දී මෙන් නගරවල සුලු නිෂ්පාදකයන් ද, පුහුනු ශිල්පීන් ද, අත්කම් ශිල්පීන් ද සාමූහිකයක් එහි නොසිටියහ. ඒ වෙනුවට එහි සිටියේ කාර්මික කම්කරු සමුදායකි.

රුසියානු විප්ලවයේ පියා ලෙස හැඳින්වූ ප්ලෙකනොව් අවධාරනය කලේ රුසියානු වර්ධනය, බටහිර යුරෝපය ගත් මාවත අනුගමනය කරනු ඇති බවයි. ඒ අනුව කම්කරු පන්තිය, ධනේශ්වරයට ඓතිහාසිකව පැවරී ඇති කර්තව්‍යය, එනම් ධනේශ්වර විප්ලවය ක්‍රියාවට නැගීමෙන් ඔවුන් වලක්වන පරිදි බියගැන්වීම් නොකර "උපායශීලීව" කටයුතු කල යුතු ය.

රුසියානු විප්ලවයේ ධනේශ්වර ස්වභාවය පිලිබඳව ප්ලෙකානොව් සමග එකඟවන අතර ම ලෙනින්, එහි පන්ති ගතිකය කරා වඩාත් ගැඹුරට විනිවිද ගියේ ය. ඔහු අවධාරනය කලේ ප්ලෙකානොව් ගේ

සැලැස්මට අනුව ධනේශ්වරයට පවරාදී ඇති කාර්යභාරය ඉෂ්ඨ කිරීමට ඔවුන් අසමත් බවය. කම්කරු පන්තිය, ධනේශ්වර ප්‍රජාතන්ත්‍රීය විප්ලවයේ වඩාත් රැඩිකල් රූපාකරය ඉදිරියට ගෙනයා යුතුව ඇත.

රුසියානු විප්ලවයේ හදවතෙහි ම තිබූ, වැඩිමනත්ව සඳහන් කලොත් වැඩවසම් රාජ්‍යය තුල ඉතිරිව තිබූ සියල්ල පෙරලා දැමිය යුතුව තිබුනි. මෙහි අර්ථය වූයේ රාජ්‍යය රඳා පැවතුනා වූ වංශවතුන්ගේ ඉඩම්, අත්පත් කර ගත යුතු බවයි. එබැවින් ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය, "කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී ආඥාදායකත්වයේ" රූපය ගත යුතුව ඇතැයි ලෙනින් තර්ක කලේය. කම්කරු පන්තිය හා ගොවි ජනතාව බලය හවුලේ බෙදාගනිමින් ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය අවසානය දක්වා ගෙන යා යුතුය.

ඉදිරිදර්ශනයේ අතිමූලික වෙනසක් සනිටුහන් කල ට්‍රොට්ස්කිගේ ඉදිරිදර්ශනය, ලෙනින්ට හා ප්ලෙකානොව් ට වඩා වෙනස් විය. ලෙනින් හා ප්ලෙකානොව් අතර වෙනස්කම් තිබිය දී ම ඔවුන් පොදු ආරම්භක කාරනයකට එකඟ වූහ. ඔවුන් විප්ලවය තක්සේරු කලේ රුසියාව තුල සංවර්ධනයේ මට්ටම හා පන්ති බලවේගයන්ගේ සම්බන්ධතාවන්ට අනුව ය. ට්‍රොට්ස්කි අවධාරනය කලේ විප්ලවය, එය දිගහැරෙමින් තිබූ ලෝක තත්වයෙන් හා ඒ තුල තක්සේරු කල යුතු බවයි.

රුසියානු විප්ලවය පිලිබඳව ලෙනින්ගේ තක්සේරුව හා විප්ලවය සම්බන්ධ ප්‍රශ්නය මුල් කර ගෙන ලෙනින් ප්ලෙකානොව් ගැන කල විවේචන සමග ට්‍රොට්ස්කි එකඟ විය. එහෙත් ඔහු තවත් එහාට යමින් ලෙනින්ගේ ආස්ථානයෙහි දුර්වලකම පෙන්වා දුන්නේය. "කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී ආඥාදායකත්වය" යන සූත්‍රයෙන් නායකත්වයේ කාර්ය භාරය ඉෂ්ඨ කරන්නේ කුමන පන්තිය ද යන ප්‍රශ්නය පැහැදිලි නො කරයි.

ඔහු සඳහන් කලේ, ලෙනින්ගේ ඉදිරිදර්ශනය යම් වර්ගයක ආත්ම පරිත්‍යාගී ආඥා පනතක් වැනි දෙයක් බවය. එනම් බලය අල්ලා ගන්නා කම්කරු පන්තිය තනිකර ම ප්‍රජාතන්ත්‍රවාදී කර්තව්‍යයන්ට සීමා විය යතු අතර ධනේශ්වරයේ බලයට අභියෝග නොකල යුතු ය. එහෙත් මෙම සැලැස්ම විප්ලවයේ ම ගතිකය විසින් අභියෝගයට ලක් කලේ ය. කම්කරු පන්තියට, තමන්ගේ ම අරගලයේ තර්කනය විසින් දේශපාලන බලය අල්ලා ගැනීමටත් ධනේශ්වරය පෙරලා දැමීමටත් බල කෙරෙයි. කම්හල් වසා දැමීමට හා දොට්ටදැමීම්වලට එරෙහිව පැය අටේ වැඩ දිනය වැනි තනිකර ම ප්‍රතන්ත්‍රවාදී වූ ඉල්ලීම්වලට ධනේශ්වරය විරුද්ධ වීම 1905 විප්ලවයේ එක් පාඩමකි. එවන් ප්‍රජාතනත්‍රවාදී ඉල්ලීම් දිනා ගැනීමට නම් කම්කරු පන්තිය, ධනේශ්වරය වෙතින් දේශපාලන බලය උදුරා ගෙන සමාජවාදී පියවර ගැනීමට මුල් විය යුතු ය.

එවිට මතුවන ප්‍රශ්නය නම් රුසියාවේ ජනගහනයෙන් ඉමහත් බහුතරයක් වූ ගොවීන්ට වඩා සංඛ්‍යාවෙන් සුලුතරයක් වූ කම්කරු පන්තියට බලය පවත්වා ගෙන යා හැක්කේ කෙසේද? යන්නයි. රුසියාව තුල පැවති තත්වයේ දෘෂ්ටි අස්ථානයෙන් සැලකූ කල ට්‍රොට්ස්කිගේ ඉදිරිදර්ශනය ශක්‍ය නොවීය. එහෙත් හරියට ම ගැටලුව වූයේ විප්ලවය, වෙන්ව ගත් කල රුසියාවේ දෘෂ්ටි ආස්ථානයේ සිට පමනක් නීර්නය කල නොහැකි වීමයි. එය ලෝක සංදර්භයක නීර්නය කල යුතු ය. එවිට මුලුමනින් ම පාහේ වෙනස් නිගමනයන් ගලා එයි.

ප්ලෙකානොව් විසින් ඉදිරිපත් කල සැලැස්ම යෝජනා කල අය එංගලන්ත ධනේශ්වර ක්‍රමයේ වර්ධනය, සෑම රටක ම අනාගතය පෙන්නුම් කලේය යන මාක්ස්ගේ ප්‍රකාශනය ගැන සඳහන් කරති. එහි ඇඟවීම වූයේ රුසියාවේ සමාජවාදී විප්ලවයට තවත් සැලකිය යුතු දුරක් යාමට සිදුව ඇති බවයි.

මෙයට පිලිතුරු දුන් ට්‍රොට්ස්කි, මේ නම් මුලුමනින් ම මාක්ස් යාන්ත්‍රික ලෙස අර්ථ දැක්වීමක් බව ප්‍රකාශ කලේය. ඉංග්‍රීසි ධනවාදයේ වර්ධනය අනෙකුත් ජාතීන් විසින් ද අනුගමනය කල යුතු මුද්‍රිත ආකෘතියක් වැනි දෙයක් නොවීය. ධනේශ්වර සංවර්ධන ක්‍රියාවලිය මාක්ස්ගේ ම ජීවගුනය සහිතව විශ්ලේෂනය කිරීම අවශ්‍ය විය. එවිට පැහැදිලි වනු ඇත්තේ බ්‍රිතාන්‍ය තුල ධනවාදයේ වර්ධනය, අනෙක් රටවලටත් යොදාගත හැකි යම් ආකෘතියක් නොව එය, බ්‍රිතාන්‍ය තුල ආරම්භයේදී වර්ධනය වූ ආකෘතිය ඉක්මවා ගිය ආර්ථික ක්‍රියාවලියක ආරම්භය බවය. එය දැන් සමස්ත ලෝකය ම වෙලාගෙන ඇත.

1905 ජූනියේ දී ට්‍රොට්ස්කි සිය ඉදිරිදර්ශනය විස්තාරනය කලේය. "සිය නිෂ්පාදන හා වානිජ්‍ය ක්‍රමය මගින් සියලු රටවල් එකට සම්බන්ධ කල ධනවාදය, සමස්ත ලෝකය එක ම ආර්ථික හා දේශපාලන ජීවයක් බවට හරවා තිබේ. අදෘශ්‍යමාන බැඳීම් මගින් දහස් ගනන් ව්‍යවසායන් එකට බැඳ දමන නූතන නය ක්‍රමය සේ ම සහ, බොහෝ කුඩා බංකොලොත්වීම් වලක්වා ගන්නා අද්විතීය චලනයක් සඳහා ප්‍රාග්ධනයට ඉඩ සලසන්නේ වී නමුත් ඒ සමග ම එය, පෙර නො වූ විරූ අකාරයේ පොදු ආර්ථික අතුගා දැමීමක හේතු කාරකය ද වන අතර මේ අකාරයට ධනවාදයේ සමස්ත දේශපාලන හා ආර්ථික ව්‍යායාමය, එනම් ලෝක වෙලඳම, රාජ්‍ය නය ගැති භාවයේ එහි යෝධ පද්ධතිය, හා සියලු වර්ගයේ ප්‍රතිගාමී බලවේගයන් එය තුලට ඇදගන්නා ලෝක පරිමාන හවුල් ව්‍යාපාර වස්තු සමාගමක් වැනි දෙයක් වන ජාතීන්ගේ දේශපාලන කාන්ඩ ගැසීම සියලු ම පෞද්ගලික දේශපාලන අර්බුදයන්ට හරස්කපනවා පමනක් නොව පරිමානයෙන් පෙර නො වූ විරූ දේශපාලන අර්බුදයක් සඳහා පදනම ද සකස් කරයි...

"මෙයින්, දැන් දිග හැරෙමින් තිබෙන සිදුවීම්වලට ජාත්‍යාන්තර ස්වභාවයක් වහා ම අත් කර දෙන අතර ම පුලුල් බුද්ධිමත් ක්ෂේත්‍රයක් ද විවෘත කර දෙයි. කම්කරු පන්තිය විසින් මෙහෙයවූ රුසියාවේ දේශපාලන විමුක්තිය, එම පන්තිය මෙතෙක් ඉතිහාසයේ නොදුටු විරූ ඉහලකට ඔසවා තබනු ඇති අතර ඒ කරා ඉමහත් බලයක් හා සම්පත් ද ගෙන එනු ලබයි. එමෙන් ම ඔවුන් ලෝක ධනවාදය අහෝසි කිරීමේ ප්‍රාරම්භකයන් බවට ද පත්කරනු ඇත. ඒ සඳහා සියලු වෛෂයික කොන්දේසි ඉතිහාසය විසින් සම්පාදනය කර තිබේ." (ලියොන් ට්‍රොට්ස්කි, නොනවතින විප්ලවය හා ප්‍රතිපල හා අවස්ථාවන්, පිටු. 239-240. )

## ප්‍රථම ලෝක සංග්‍රාමය

1905 විප්ලවයේ ගමන් මාවත ඔස්සේ නැඟෙමින් තිබූ ඉදිරිදර්ශනය හා ක්‍රියාමාර්ගය පිලිබඳ සියලු ප්‍රශ්න, ධනේශ්වර මහා බලවතුන් අතර කැකෑරෙමින් තිබූ දිගුකාලීන ආතතීන් 1914 ප්‍රථම ලෝක සංග්‍රාමයේ ස්වරූපයෙන් පුපුරා ගිය විට, මතුපිටට පැමිනියේ ය. ධනේශ්වර සංවර්ධනයේ ඓතිහාසිකව ප්‍රගතිශීලී අවධියේ අවසානය යුද්ධය පැන නැඟීමෙන් සලකුනු කල අතර නව යුගයක් ආරම්භ වූයේ ෆ්‍රෙඩ්රික් එංගල්ස් අනතුරු ඇඟවූ පරිදි සමාජවාදය ද ම්ලේච්ඡත්වය ද යන ප්‍රශ්නය මනුෂ්‍ය වර්ගයා හමුවට ගෙන එමිනි.

ළමාවිය පවා නො ඉක්මවූ පිරිමි ළමුන් ද ඇතුලු තරුනයන් මැෂින් තුවක්කු උන්ඩවල ගෙදුරු ලෙස නිතිපතා යුද පෙරමුනට පිටත්කර හැරි අතර භීෂනයේ පරිමාව විස්තර කිරීම පවා දුෂ්කර ය. ජර්මානු අධිරාජ්‍ය ආන්ඩුව විසින් සිරගත කොට සිටිය දී රෝසා ලක්සම්බර්ග්, දිගහැරෙමින් තිබූ ව්‍යසනය පහත සඳහන් පරිදි විස්තර කලාය.

"දර්ශනය බෙහෙවින් වෙනස් වී තිබේ. පැරිසිය කරා ගිය සති හයක හමුදා පෙලපාලිය ලෝක නාඩගමක් විය. ජන සංහාරය ඒකාකාරී සිද්ධියක් බවට පත්ව තිබේ. එහෙත් අවසාන විසඳුම කරා අඩියක් වත් ලංවී නැත. ධනේශ්වර පාලනය එහි ම උගුලට හසුව සිටියි. ඔවුන් ම පිහිට පැතූ භූතයා පාලනය කර ගත නොහැකිව ඇත.

"පහව ගියේ ප්‍රථම පිස්සු භ්‍රාන්තිය යි. දර්ශනය අවසන්ව තිබේ. හමුදා භටයන්ගෙන් පිරුනු දුම්රිය, උද්යෝගීමත් අඹුවන්ගේ ප්‍රීති ඝෝෂා මධ්‍යයේ නතර කරන විට, ඒවායේ තිරය පහත වැටී තිබේ. අපට තවදුරටත් ඔවුන්ගේ සිනහ මුසු මුහුනු දක්නට නොලැබේ. යුද්ධයෙන් උමතුවට පත් ජනකාය වෙත දුම්රිය කවුලු තුලින් ප්‍රීතිමත්ව සිනහසෙන අය දක්නට නැත. සිය ගමන් මලු උරහිසෙහි එල්ලා ගත් ඔවුහු වීදි හරහා සෙමින් පිය නඟති. බිය මුසු මුහුනින් යුත් ජනතාව සිය දෛනික කටයුතු වල නිමග්නව සිටිති.

"සුදුමැලි අරුනෝදයේ මූලාවට පත් වාතාවරනය තුල වෙනත් ගායනයක හඬ ද අසන්ට ලැබේ. යුදපිටියේ උකුස්සන්ගේ හා හෙයිනාවන්ගේ ගොරහැඩි මොරගෑම යි ඒ. අගෝස්තුවේ හා සැප්තැම්බරයේ දී දුම්රියවලට පැටවූ යුද්ධයේ ගොදුරු, බෙල්ජියමේ හා වෝජස් හි යුදපිටිවල කුනුවෙමින් තිබේ. ඒ අතර සොහොන් බිම්වල වල් පැලෑටි මෙන් ලාභය දලුලමින් වැඩෙයි.

"ලජ්ජාවටත් අපකීර්තියටත් පත් වූ, ජරාව වැගිරෙන, ලේ නාගත් ධනවාදී සමාජය එසේ පවතියි. අප සාමාන්‍යයෙන් දැක ඇති පරිදි, ආචාර ධර්මයේ හා දර්ශනවාදයේ නියමය, ධාර්මිකවත් සාමකාමීවත් ඉටු කිරීමේ ක්‍රියා කලාපය වෙනුවට මරහඬ තලන සත්වයෙකු වන්, අරාජකත්වයේ මධුපානෝත්සවයක් වන්, වසංගත කාරක පවනක් වන් විනාශයට පත්වන මනුෂ්‍යත්වය හා සංස්කෘතිය දැකගත හැකිය. (ධනවාදය) එය එහි සියලු ම සැඟවුනු නග්නත්වයෙන් ප්‍රාදූර්භූතව ඇත."

1905 දී වර්ධනය කල විශ්ලේශනය, යුද්ධය පුපුරා යාමත් සමඟ ම ට්‍රොට්ස්කි විසින් තවදුරටත් ගැඹුරු කලේ ය. යුද්ධය වනාහි, සියලු ම කොටස් බද්ධ කර ගනිමින් ලෝක ක්‍රමයක් ලෙස වැඩී ගිය ධනවාදී ලෝක අර්ථිකය හා එකිනෙකට ගැටෙන, සතුරු ජාතික රාජ්‍යයන් වශයෙන් ලෝකය බෙදී යාමත් අතර හටගත් ප්‍රතිවිරෝධයේ ප්‍රතිපලය විය. සෑම ධනේශ්වර මහා බලවතෙක් ම මෙම ප්‍රතිවිරෝධය ජයගැනීමට උත්සාහ කලේ තමන් ලෝක බලවතෙකු ලෙස නැඟීගැනීමෙන් ය. මෙය සෑම අයෙක්ම සියල්ලන්ට එරෙහි අරගලයකට ඇද දැමීමට තුඩුදුන්නේ ය. ධනේශ්වර අර්ථිකයේ ප්‍රතිසතිතාවන් ප්‍රගතිශීලී පදනමක විසඳිය හැක්කේ ලෝක සමාජවාදී විප්ලවය තුලින් පමනකි. ඒ යම් දුරස්ත ඉදිරිදර්ශනයක් ලෙස නොව, අධිරාජ්‍යවාදී ම්ලේච්ඡත්වයට එක ම යථාර්ථවත් පිලිතුර ලෙස ය.

යුද්ධයේ පුපුරා යාම, රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරය තුල අවස්ථාවාදයට එරෙහිව ලෙනින් විසින් ගෙන ගිය අශමනීය අරගලයේ වෛෂයික වැදගත්කම තහවුරු කලේ ය.

දෙවෙනි ජාත්‍යන්තරයේ පක්ෂ - සියල්ලටමත් වඩා දෙවෙනි ජාත්‍යන්තරයේ විශාලතම ශාඛාව වූ ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය - යුද අයවැයට පක්ෂව ඡන්දය දීම මගින් කම්කරු පන්තිය පාවා දුන්නේය. මෙම ඓතිහාසික පාවාදීම පෙන්නුම් කලේ ලෙනින් සටන් වැදුනු ප්‍රවනතාවන් යම් රුසියානු සංසිද්ධියක් නොව ජාත්‍යන්තරව ඔඩුදුවා තිබුන එකක් බවයි.

මෙම ප්‍රවනතාවන්ගේ මූලයන් පැවතුනේ ධනවාදයේ ඓතිහාසික සංවර්ධනය තුලය. කම්කරු ව්‍යාපාරය තුල නායකත්වයේ ඉහල ස්තරයක කුනුවීමට ද තුඩු දුන්නේ ප්‍රධන ධනේශ්වර බලවතුන්ගේ ගෝලීය අරගලයට හේතු වූ එම ක්‍රියාවලීන් ම ය. යටත්

විජිතවලින් කොල්ලකෑ සම්පත් ද මූල්‍ය පරපුටුකමේ වර්ධනය ද කම්කරු වංශවතුන් නිර්මානය කිරීම සඳහා ද්‍රව්‍යමය පදනම දැමීය. සමාජ අවස්ථාවාදය, ජාත්‍යන්තරවාදය ප්‍රසිද්ධියේ ම අත හැර දැමීම, හා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී නායකයන් "තමන්ගේ ම" ධනේශ්වරය සමග හවුල්වීම නායක පුද්ගලයන්ගේ පෞද්ගලික අසමත්කමට සිඳවිය නොහැකි ය. පාවාදීම පුද්ගලික වූයේ නැත. එය සමාජ සංසිද්ධියකි. ඒවායේ ද්‍රව්‍යමය මූලයන් හෙලිකර ගැනීම අත්‍යාවශ්‍ය ය.

"සියලු ම මහා බලයන්ගේ ධනපතියන් යුද්ධය ගෙන යන්නේ ලෝකය බෙදා ගැනීමට හා සූරාකෑමට ය. එමෙන් ම අනෙකුත් ජාතීන් මැඩීමට ය. ධනපතියන්ගේ ලාභයෙන් අල්පයක් කම්කරු නිලධරයේ, කම්කරු වංශවතුන්ගේ, හා සුලු ධනපති සහකරුවන්ගේ කුඩා කොටසක් වෙත ගලා එනවා විය හැකිය. සමාජ අවස්ථාවාදීන්ට හා අවස්ථාවාදීන්ට ඇත්තේ එක ම පන්ති පදනමකි. කෙටියෙන් කිව හොත් වරප්‍රසාදිත කම්කරුවන්ගේ කුඩා කොටසක් "ඔවුන්ගේ" ජාතික ධනපතියන් සමග කම්කරු පන්තික ජනතාවට එරෙහිව සංධාන ගතවේ. ධනේශ්වරයේ හෙංචයියන් හා ධනේශ්වරය අතර පසුව කී කොටසේ සූරාකෑමට ලක් වන පන්තියට එරෙහිව සන්ධානයක් පවතියි." (ලෙනින් එකතුකල කෘති, 22 වන වෙලුම 112 වන පිටුව )

දෙවෙනි ජාත්‍යන්තරයේ නායකයන් යුද්ධයට සහාය දීම තුලින් කම්කරු පන්තිය පාවාදීමෙන් පසු, ජාත්‍යන්තරය පුනර්ජීවනය කල නොහැකිය. සමාජවාදී විප්ලවයේ අර්ථයෙන් ගත් කල එය මියගොස් ය. ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරය නව යොමුවක් සහිතව ප්‍රතිසංවිධානය කිරීම සඳහා නව ජාත්‍යන්තරයක් ගොඩනැගීම අවශ්‍ය විය. ලෙනින් ප්‍රථමයෙන් මෙය යෝජනා කලේ ආන්තික හුදෙකලාවේ කොන්දේසි යටතේ 1914-15 කාලයේ ය. රුසියානු විප්ලවයෙන් පසුව නො වේ. ට්‍රොට්ස්කි පසුව පැහැදිලි කල පරිදි, ජාත්‍යන්තරවාදය "ජාත්‍යාන්තර ව්‍යසනයේ ගිනි ජාලාව හා දුමාරය තුල එක්වර ම නොපෙනී ගිය" බවක් දක්නට ලැබුනි. එය "දීප්තියෙන් අඩු ගිනි සිලු ලෙස" විවිධ රටවල වෙන ම කන්ඩායම් ලෙස යලි මතුව ආ කල, එය යම් වර්ගයක මනෝරාජික කල්ලියක අවසන් හුස්මක් ලෙස විවිධ වර්ගවල ධනපති නියෝජිතයන් විසින් අවඥාවෙන් බැහැර කලහ.

ඔවුන්ගේ කාලයේ හා අපේ කාලයේ මත් සියලු වර්ගවල අවස්ථාවාදීන්ට විසංසන්දනාත්මකව විප්ලවවාදී ජාත්‍යන්තරවාදීන් ඒ වන විට ක්ෂනිකව සාක්ෂාත් කර ගත හැකි හෝ දිනාගත හැකිය යි පෙනී ගිය දෙයට අනුව කටයුතු නොකලහ. ඔවුන් තෙමේ ම පදනම් වූයේ සිද්ධීන්ගේ වෛෂයික තර්කනය මත ය. ධනපතියන් විසින් මහජනතාව රවටනු ලැබූහ. සිය යුද අරමුනුවලට සහාය පිනිස ප්‍රතිගාමී ජාතික අගතීන් මෙන් ම සෑම නින්දිත කමක්ම ප්‍රයෝජනයට ගත්හ. ඔවුන් (කම්කරුවන්) ඔවුන්ගේ ම නායකයන් විසින් ද පාවා දෙනු ලැබූහ. එහෙත් ධනේශ්වරයට ජනතාවගේ අවශ්‍යතාවන් කිසිවක් ඉටු කල නොහැකිය. ඔවුන්ගේ (කම්කරුවන්ගේ) මුලාව ඉක්මනින් ම පහව ගොස් ජාත්‍යන්තර පරිමානයේ සමාජ හා දේශපාලන නැගිටීම් උද්ගත කරනු ඇත.

**මතු සම්බන්ධයි .**

© www.wsws.org